# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My Ref. | CSS/7/1/9 | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2018.07. 31 |

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 01-2018

දකුණු පළාතේ සියලු ම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත,

**<u>භාවිතයෙන් ඉවත් කරන ටයර් අපහරණය කිරීම</u>**

පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත අධිකාරී හා ආයතනයන් සතු වාහනවල භාවිතයෙන් ඉවත් කරන ටයර් අපහරණය කිරීම විධිමත් ක්‍රමවේද අනුගමනය කර නිසි පරිදි සිදු නොවීම නිසා ගැටළු රාශියක් මතු වී ඇති බව අනාවරණය වී ඇත.

02. වාහනවල භාවිතයෙන් ඉවත් කළ ටයර් දිගු කාලයක් ගබඩාවල හා කාර්යාල පරිශ්‍ර තුළ රඳවා තබා ගැනීම නිසා වෙනත් රාජකාරී සඳහා භාවිතා කිරීමට පවතින ඉඩකඩ සීමා වීම, එළිමහන් කාර්යාල පරිශ්‍ර තුළ අවිධිමත්ව ගබඩා කිරීමෙන් ඩෙංගු මදුරුවන් බෝ වීම වැනි පරිසර ගැටළු උද්ගත වීම, කාර්යාල පරිශ්‍රය අපවිත්‍ර වීම හා කාර්යාල අලංකරණය නැති වීම, වෙන්දේසි කිරීමේ දී භාවිතයෙන් ඉවත් කළ ටයර්වලට සාධාරණ ආර්ථික වටිනාකමක් රජයට නොලැබීම, පැරණි ටයර් ආරක්ෂා කර තබා නොගැනීම හා අයථා පරිහරණයට පෙළඹීම වැනි ගැටළු උද්ගත වන අවස්ථා නිරීක්ෂණය විය.

03. එබැවින්, මින් ඉදිරියට පළාත් සභා ආයතන සතු වාහනවල භාවිතයෙන් ඉවත් කළ ටයර් අපහරණය කිරීමේ දී, පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කරන ලෙස කාරුණිකව දන්වමි.

1. ඔබ ආයතනය සතු වාහනවල ටයර් නියමිත දුර ප්‍රමාණය ධාවනය කළ පසුව, එක් එක් වාහනයට අලුතින් ටයර් මිල දී ගැනීමට මිල ගණන් කැඳවීමේ දී, එම වාහනයේ භාවිතයෙන් ඉවත් කිරීමට නියමිත පැරණි ටයර් විකිණීම සඳහා මිල ගණන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. (මිල ගණන් කැඳවන ලිපියේ භාවිතයෙන් ඉවත් කරන ටයර් ඉල්ලුම් කරන මිල ද කැඳවිය යුතුය.)

2. සැපයුම්කරුවන්ගෙන් ලැබුණු මිල ගණන් ඇගයීමේ දී, භාවිතයෙන් ඉවත් කළ ටයර් සඳහා ඉල්ලුම් කරන මිල ද සැලකිල්ලට ගෙන තාක්ෂණ ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් ආර්ථිකමය වශයෙන් වඩාත් ම සුදුසු සැපයුම්කරු තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. එහි දී, නව ටයර් සඳහා ඉදිරිපත් කරන මිල ගණනින් පැරණි ටයර් විකිණීමේ දී ඉල්ලුම් කරන




ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් 1 ට එන යහපාලනයක්"

මිල අඩු කර ශුද්ධ වටිනාකම මත තාක්ෂණ ඇගයීම් කමිටුව තරඟකාරී මිල ගණන් සැසඳීම කළ යුතුය.

3. වාහනවල භාවිතයෙන් ඉවත් කරන පැරණි ටයර් සඳහා මිල ගණන් කැඳවීමේ දී, එම පැරණි ටයර් ධාවනය කර ඇති දුර ප්‍රමාණය, ටයර් වර්ගය හා ප්‍රමාණය, ටයරයේ පොට ප්‍රමාණය යනාදී විස්තර සඳහන් කළ යුතුය.

4. වාහනවල භාවිතයෙන් ටයර් ඉවත් කිරීමේ දී, ටයර් වර්ගය, ප්‍රමාණය (Tyre Size), ටයර් අංක, ධාවනය කර ඇති දුර යනා දී විස්තර එක් එක් වාහනයේ ලොග් පොතෙහි හා අදාළ ලේඛනවල අනිවාර්යයෙන් ම සටහන් කළ යුතුය.
(අදාළ වාහනයට ටයර් සවි කිරීමේ දී, සටහන් කර තිබූ අංක හා භාවිතයෙන් ඉවත් කළ ටයර්වල අංක සසඳා පරීක්ෂා කිරීම වාහන විෂය භාර නිලධාරීගේ වගකීම වේ.)

5. නව ටයර් මිල දී ගැනීම සඳහා තෝරා ගත් සැපයුම්කරු වෙතින් ටයර් මිල දී ගෙන සවිකිරීම, වාහනයෙන් භාවිතා කළ ටයර් ඉවත් කර භාර දීම හා ඊට සම්බන්ධ සියලු කටයුතු ආයතන ප්‍රධානීන්ගේ විධිමත් අනුමැතියෙන් සිදු විය යුතු වේ.

6. විශාල වාහන සංඛ්‍යාවක් පරිහරණය කරන ආයතන විසින් එකවර ටයර් තොග මිල දී ගෙන ගබඩා කර අවශ්‍යතාවය පරිදි නිකුත් කිරීම සිදු වන්නේ නම්, මිල ගණන් කැඳවන අවස්ථාවේ දී, ඒ වන විට, ධාවනයෙන් ඉවත් කර ගබඩා කර ඇති ටයර් තොගය සඳහා ම ඉල්ලුම් කරන මිල ගණන් කැඳවීම කළ හැකිය.

04. ඉහත ක්‍රමවේදය අනුගමනය කිරීම තුළින්, පළාත් සභා ආයතනවල වාහනවල භාවිතයෙන් ඉවත් කෙරෙන ටයර් ගබඩා කර තබා ගැනීමේ දී හා අලෙවියේ දී පැන නැගී ඇති ගැටළු නිරාකරණය කර ගැනීමටත්, භාවිතයෙන් ඉවත් කරන ටයර් සඳහා ආර්ථිකමය වශයෙන් සාධාරණ වටිනාකමක් රජයට ලබා ගැනීමටත් හැකි වනු ඇත. මේ පිළිබඳව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලු ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ආර්.සී ද සොයිසා,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් : -

01. සහකාර විගණකාධිපති, දකුණු පළාත : 2018.03.05 දින පැවති ප්‍රධාන ලේකම් කාර්යාලයීය විගණන කළමනාකරණ කමිටු රැස්වීමේ දී ගන්නා ලද තීරණය අනුව නිකුත් කරන ලදී.
02. විගණන අධිකාරී - ගාල්ල / මාතර / හම්බන්තොට : දැ.ගැ.ස.
03. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත : දැ.ගැ.ස.
04. ගණකාධිකාරී (සැපයුම්), ප්‍රධාන ලේකම් කාර්යාලය : දැ.ගැ.ස. හා අ.ක.ස.